# ගම හා ගැමියා

ගම යනු කුමක් ද? ඊනියා ප්‍රබුද්ධයන්ට අනුව අද ලංකාවේ ගමක් යනුවෙන් දෙයක් (භූතාර්ථයක් ඒකකයක්) නැත. එහෙත් මොවුන්ගෙන් ඇතැමුන්ට අනුව ගමක් දෝ මොකක් දෝ එකක් ඇත. නගරයෙන් ඈත හෝ එතරම් ඈත නොවූ ඒ මොකක්දෝ තැන්වල ඇතැයි කියන ගැමිකම ගැන ඔවුහු චිත්‍රපටි නිෂ්පාදනය කරති. මේ ගම ගැන අද බටහිර සමාජ විද්‍යාවට අර්බුදයක් වෙයි. බටහිර සමාජ විද්‍යාවට ගමක් යනු කුමක් දැයි දැනගැනීමට ක්‍රමයක් නැත. ගමක් නිර්වචනය කරන්නේ කෙසේ දැයි බටහිර සමාජ විද්‍යාව නොදනියි. ගැමියා යනු කවුදැයි හඳුනාගැනීමට බටහිර සමාජ විද්‍යාවට නොහැකිය. මෙයින් කියැවෙන්නේ එක්කෝ අද ගම් හා ගැමියන් නැත යන්නය. එසේත් නැත්නම් ගම් හා ගැමියන් හඳුනාගැනීමට නොහැකි බටහිර සමාජ විද්‍යාවේ බංකොළොත් බවය. බටහිර සමාජ විද්‍යාවේ බංකොළොත් බව විශ්වාස කිරීමට අකමැති ඊනියා ප්‍රබුද්ධයෝ අද ලංකාවේ ගම් හා ගැමියන් නැතැයි කියති.

මේ රටේ සමාජ විද්‍යාඥයන් ලෙස හැඳින්වෙන අය දළ වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. මොවුහු සියල්ලෝ ම බටහිර සමාජ විද්‍යාව උගත්තෝ වෙති. එහෙත් ඔවුන්ගෙන් ඇතැම්හු තම මුල් නැති කර ගත් පාවෙන චරිත වෙති. බොරු පංඩිත කතා කියන මොවුන්ට කළ හැක්කේ බටහිර සමාජ විද්‍යාවේ ලොක්කන්ගේ මත ඇද බෑම පමණකි. මොවුන්ගේ සියලු කතා බටහිර සමාජ විද්‍යාවේ ප්‍රවාද සනාථ කිරීම සඳහාය. අද බටහිර රටවල ගම් නොමැති බැවින් මෙරට ද ගම් නැතැයි මොවුහු කියති. බටහිර සමාජ විද්‍යාව උගත් අය අතර ද තම මුල් සිඳ නොගත්තෝ වෙති. කැලණිය විශ්ව විද්‍යාලයේ ද එවැනි අය පළමු වැනිදා ම දැක ගැනීමට ලැබී මම සතුටට පත් වීමි. ජනමාධ්‍යවේදියකු ලෙස කටයුතු කරන මාලින්ද සෙනෙවිරත්න මහතා ද බටහිර සමාජ විද්‍යාව උගත් තරුණයෙකි. ඔහු ද තම මුල් සිඳ නොගත්තෙක් වෙයි. පසුගියදා ඔහු කියා තිබුණේ මෙරට ගැමියන් ඉන්නා බවය. ගැමි සුවඳ දැනෙන, ඉපනැල්ලේ සුවඳ දන්නා ගැමියන් ගැන ඔහු සඳහන් කර තිබුණේය.

බටහිර සමාජ විද්‍යාව ද ඇතුළු බටහිර සමාජයීය විද්‍යාවන්හි මෙරට ආධිපත්‍ය ඇත්තේ මුල් සිඳ ගත්තවුන්ටය. මෙරට කරුමය එය වෙයි. බුදු දහම පාවාදීම ගැන ලියන තම්බයියලාට, පැවිදි කිරීමේදී නැති වන ළමා අයිතිවාසිකම් ගැන කතා කරන ඔබේසේකරලාට, රජුන්ගේ භූමිකා රඟන භික්ෂූන් වහන්සේලා ගැන ලියන සෙනෙවිරත්නලාට මෙන්ම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියේ ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා රෙඩ්ෆීල්ඩ් නිපදවා ගත් මහා සම්ප්‍රදාය නම් තකතීරු සංකල්පය ගැන කිසිම දැනුමක් නැතිව ඒ ගැන දොඩවන අවශේෂලාට මෙරට සමාජ විද්‍යාවෙහි ඇත්තේ ආධිපත්‍යයකි. ඔවුන්ට මේ ආධිපත්‍යය ලැබී ඇත්තේ ඔවුන්ගේ සුවිශේෂ බුද්ධියක් හෝ දක්ෂකමක් හෝ නිසා නොව ඔවුන් බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි නියෝජිතයන් බැවිනි. මේ ආධිපත්‍යය හැකි ඉක්මණින් බිඳ හෙළීම මේ රටේ යහපත සඳහා ම වෙයි. මාලින්ද සෙනෙවිරත්න මහතා ඇතුළු බොහෝ දෙනා කියන මේ ගැමි සුවඳ කුමක්ද? ඉපනැල්ලේ සුවඳ දැනෙන්නේ කාටද? මේ සුවඳ දැන ගැනීමට හැක්කේ මඩ තවරාගෙන කුඹුරු වැඩ කරන අයට පමණක්ද? කිසිසේත් ම නැත. කුඹුරු වැඩකිරීම හෝ නොකිරීම හෝ මෙහි දී නිර්නායකයක් නොවෙයි. මේ සුවඳ දැනෙන්නේ බටහිර දැනුම සෙම්ප්‍රතිශ්‍යාව නොවැළඳුනු අයටය. ඇතමුන්ට බටහිර දැනුම් නියුමෝනියාව ද වැළඳී ඇත.

මෙරට ගම හා ගැමියන් ගැන තේරුම් ගැනීමට නම් බටහිර සංස්කෘතික ආධිපත්‍ය හා බටහිර චින්තන ගැන යම් අවබෝධයක් තිබිය යුතුය. ඒ සඳහා අපේ දැනුමක් තිබිය යුතුය. බටහිරයන්ගේ සමාජ විද්‍යාත්මක දැනුමෙන් බලා මෙරට සමාජය ගැන කිව හැක්කේ කුමක්ද? ලෝකයේ සියලු සමාජ එකම ආකාරයක ප්‍රවාද ඇසුරෙන් දැන ගත හැකිද? අප මත පටවන දැනුම් ආධිපත්‍යය හා සංස්කෘතික ආධිපත්‍යය ගැන අපට දැන ගත හැක්කේ බටහිරයන්ගේ දෘෂ්ටි කෝණයෙන් බලා නොවේ.

බටහිර නූතනත්වය පහළවීම පිළිබඳ කෙටි හැඳින්වීමක් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය මැයෙන් පළ වූ ලිපියේ සඳහන් විය. පහළොස්වැනි සියවසේ පුනරුදය සමග ඇරඹි නූතනත්වය රෙපරමාදු ප්‍රතිසංස්කරණය නමින් හැඳින්වෙන ක්‍ර

© Prof. Nalin De Silva

ියාවලියත් සමග බටහිර ආධිපත්‍යයට පත් විය. අදත් බටහිර ඇත්තේ නූතනත්වය ය. එය තවමත් අවසන් වී නැත. පශ්චාත් නූතනත්වය නමින් හැඳින්වෙන්නේ නව තත්ත්වයක් නොව බටහිර නූතනත්වයේ අර්බුදයක් පමණකි. පශ්චාත් නූතනත්වය යන්න දැන් බටහිර ගබ්සා වූ අදහස් මාලාවක් බවට පත්වී ඇත.

නූතනත්වය පහළ වීම හා වර්ධනය වීම පිටුපස ඇත්තේ චින්තන විප්ලවයකි. පහළොස්වැනි සියවස පමණ වන තෙක් බටහිර ආධිපත්‍යය දැරූ කතෝලික චින්තනය වෙනුවට යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ඉදිරිපත් වීම මේ චින්තන විප්ලවය වෙයි. චින්තන විල්පලයක් යනු එක රැයකින් සිදු වන්නක් නොවේ. බටහිර යුරෝපයේ කතෝලික චින්තනය පරදවා යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ආධිපත්‍යයට පැමිණීමට සියවස් තුනක් පමණ ගත විය. නූනනත්වයේ චින්තනය යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය වෙයි. බටහිර විද්‍යාව මුළුමනින්ම පාගේ වර්ධනය වූයේ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය පදනම කර ගත් නූතනත්වය තුළය. බටහිර විද්‍යාව පමණක් නොව ධනපති ක්‍රමයද මාක්ස්වාදය මාක්ස්වාදී සමාජවාදය ද බටහිර සමාජයීය විද්‍යාවන්ද බටහිර නවකතාව ද අවසානයේදී මේ චින්තනය මත පදනම් වෙයි.

මේ චින්තනයට මුළුබටහිර ම මෙන් අවසානයේදී ගොදුරු විය. අද වන විට කතෝලික පල්ලිය ද යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට යට වී හමාරය. අද ලෝකය පුරා රජ කරන්නේ ඇංග්ලිකන් ක්‍රිස්තියානියේ හෙවත් එංගලන්ත සභාවේ විකාශයක් වූ ඇමරිකන් ක්‍රිස්තියානිය වෙයි. කතෝලික චින්තනය අද බටහිර දැකගත හැකි නම් ඒ ඉතාමත් සුළුපිරිසක් අතරය. කතෝලික චින්තනය තුළ යුරෝපයේ ගම් තිබුණි. එහෙත් යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය පදනම් කර ගත් නූතනත්වය විසින් අවුරුදු පන්සියයක පමණ කාලයක් තුළ බටහිර ක්‍රමයෙන් ගම් නැති කෙරුණි. ගම් පමණක් නොව ගැමියෝ ද මුළුමනින්ම මෙන් නැති කරනු ලැබූහ. මුළු මහත් බටහිර ලෝකය ම නගරවල එකතුවක් බවට පත් කෙරිණි. මේ නගර අනුරාධපුරය වැනි නගර නොවේ. කසිකබල් ප්‍රබුද්ධයෙක් පසුගිය දිනෙක අනුරාධපුර යුගයේ ලංකාවේ තිබුණේ නාගරික සංස්කෘතියකැයි කියා තම වෘෂභ රාජ පදවිය නැවත වරක් ප්‍රදර්ශනය කළේය. සිංහල බෞද්ධ චින්තනයක් පදනම් කර ගනිමින් අනුරාධපුරයෙහි තිබූ පුර සංස්කෘතිය බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය තුළ ඉදි වූ නාගරික සංස්කෘතියට වඩා වෙනස්ය. අනුරාධපුර සංස්කෘතිය අනුරාධපුරයට පමණක් සීමා විය. එය අනුරාධපුරයෙන් ඔබ්බට නොගියේය. එහෙත් බටහිර නූතනත්වය තුළ ඇති වුණු නාගරික සංස්කෘතිය විසින් ගම් ආක්‍රමණය කෙරිණි. රෙඩ්ෆීල්ඩ්ගේ මහා සම්ප්‍රදාය සංකල්පයෙන් කෙරෙන්නේ මේ ආක්‍රමණය රටක් තුළ මෙන්ම රටවල් හරහා ද යුක්ති යුක්ත කෙරීමය.

ලංකාවේ අනුරාධපුර යුගයේ දී පැවතියේ සිංහල බෞද්ධ චින්තනයකි, පොළොන්නරු යුගයේ සිට හින්දු චින්තනයේ ද බලපෑම් එයට විය. ඉන් පෙර මහායාන තන්ත්‍රයාන ආදී බලපෑම් ද ඇති වූ නමුත් සුළු කාලයක් තුළ එක්කෝ ඒ පරාජය කිරීමට හෝ එය සිංහල බෞද්ධ සංස්කෘතියට ගැනීමට හෝ සිංහල බෞද්ධයනට හැකි විය. ලංකාවට බටහිර නූතනත්වය හා යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය පැමිණියේ පෘතුගීසීන් හරහාය. එහෙත් පෘතුගීසීහු මුළුමනින් ම එම චින්තනයට අයත් නොවූහ. ඔවුහු යම් ප්‍රමාණයකට කතෝලික චින්තනයෙහි වූහ. (යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට කතෝලික චින්තනය පැරදවීමට අවුරුදු තුන්සියයක පමණ කාලයක් ගත විය.) බටහිර නූතනත්වය ආර්ථික, දේශපාලනික හා සමාජයික වශයෙන් ලංකාව මත පැටවීමට උත්සාහ දැරුණේ රෙපරමාදු ප්‍රතිසංස්කරණයට යට වී සිටි ලන්දේසීන් අතිනි. ඇංග්ලිකන් ක්‍රිස්තියානින් වූ බ්‍රිතානියෝ ඒ ක්‍රියාදාමය තව දුරටත් ඉදිරියට ගෙන ගියහ. කෙසේ හෝ බටහිර නූතනත්වය ලංකාවට (හා අනෙක් ආසියාතික අප්‍රිකා රටවලට) පැමිණියේ බටහිර ජගත් අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙසය. එය මෙරට නෛසර්ගික වර්ධනයක් නොවීය.

බටහිරයන් තම ආර්ථික රටා හරහා මෙන්ම සංස්කෘතික බලපෑම් හරහා ද නගර හා නාගරිකයන් බිහි කිරීමට කටයුතු කළහ. ආර්ථික රටාව තුළ නගර විසින් ගම් ආක්‍රමණය කිරීමෙන් ගම් නගර බවට පත් කිරීමට බටහිරයෝ උත්සාහ කළහ. ඒ අතර ගැමියන් නාගරිකයන් බවට පත් කිරීමට තැත් කෙරුණේ සංස්කෘතික ආධිපත්‍යය හරහා ය. අවුරුදු පන්සියයකට පමණ යටත්විජිත කාල පරිච්ඡේදයක් තුළ ද තවමත් නූතනත්වයේ ආර්ථික රටාව තුළට ලංකාවේ ගම් රාශියක් ගැනීමට නොහැකි වී ඇත. ගම්වල ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිනි තිබූ පමණින් ගම් නගර බවට පත් නොවේ. ගමක් බටහිර භූරාතනත්වය තුළ නගරයක් බවට පත්කිරීමට අඩුම තරමින් ගම නගරය විසින් ආක්‍රමණය කෙරී ගම නූතනත්වයේ ආර්ථික ජාලයට රටාවට හසු කර ගත යුතුය. ගැමියන් නාගරිකයන් කිරීමට නම්

නූතනත්වයේ චින්තනය ගැමියන්ගේ චින්තනය බවට පත් කළ යුතුය. බටහිර රටවල මේ ක්‍රියාවලි දෙකම බොහෝ දුරට සමගාමීව සිදු විය. එහෙත් මෙරට තත්ත්වය එසේ නොවේ. අද මෙරට කී දෙනෙකුට යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය වේද?

යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට හසු කර ගත නොහැකි වූ යට කර ගත නොහැකි වූ කිසිවකු බටහිර නූතනත්වය තුළ නාගරිකයකු නොවේ යැයි ම සිතමි. යමකුට ඉංගිරිසි පුළුවන් ද යමකු බටහිර විද්‍යාව හදාරා ඇත් ද බටහිර සිනමා කෘති නරඹන්නේ ද නගරයේ ජීවත් වන්නේ ද ආදී කිසිවක් බටහිර නූතනත්වය තුළ නාගරිකයකු වීම සඳහා නිර්නායක නොවේ. මේ සියල්ල සම්පූර්ණ කළ ද යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට යට නොවුවෙක් ගැමියෙක් වෙයි. බටහිරයන් හඳුන්වා දීමට උත්සාහ කරන යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට සවඥානික ව හෝ අවිඥානික ව හෝ යට නොවන තැනැත්තා ගැමියකු ලෙස සැලකිය හැකිය. බටහිර දැනුම් සම්ප්‍රතිශ්‍යාව කොත්තමල්ලි බී සුව කර ගන්නා තැනැත්තා ගැමියෙකි. ඒ ගැමියන්ට හා ගම මහගේලාට සෙම්ප්‍රතිශ්‍යාව නොමැති බැවින් ඉපනැල්ලේ සුවඳ දැනෙයි. ගැමියන් ඇත්තේ ලංකාව වැනි ආසියාතික රටවල පමණක් නොවේ. බටහිර ද සුළු ප්‍රමාණයකට හෝ ගැමියෝ වෙති. බටහිර මුළුමනින්ම මෙන් නාගරික වී ඇත. එහෙත් ඉන් කියැවෙන්නේ බටහිර සියල්ලන් ම නාගරිකයන් බව නොවේ. තවමත් ගැමි ජීවිත ගත කරන්නෝ සුළු ප්‍රමාණයක් හෝ වෙති.

බටහිර සමාජ විද්‍යාව තේරුම් ගැනීමට නොහැකි වුවද මෙරට ගම් ඇත. ඒ ගම්වල නාගරිකයෝ ද වෙති. එමෙන්ම මෙරට ගැමියෝ වෙති. ඒ ගැමියෝ නගරවල ජීවත් වෙති. අපට බලෙන් පටවන ලද බටහිර නූතනත්වය විසින් ගම්වල තිබූ සමජාතීය බව නම් නැති කර ඇත. එදා ගමෙහි ජීවත් වූ සියල්ලෝ ගැමියෝ වූහ. පුරවල ද ජීවත් වූ බොහෝ දෙනෙක් ගැමියෝ වූහ. එදා පුරවල බටහිර නූතනත්වයේ තේරුමෙන් නාගරිකයන් නොසිටියද නුවරු හා පුරවම්යෝ සිටියහ. අද බටහිර ජගත් යටත්විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස ගම්වල ගැමියෝ ද නාගරිකයෝ ද ජීවත් වෙති. එමෙන්ම නගරවල ද ඔවුහු දෙකොටසම වෙති. බටහිර යටත්විජිතවාදය අප වෙනස් කිරීමට කෙතරම් දැඟළුවද මෙරට බහුතරය තවමත් ගැමියෝ වෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva